පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර)

140

විෂය නිර්දේශය

(~~1990~~ 1991 හා ඉන්පසු)

# පාලි

## පරීක්ෂණ පරිපාටිය

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය සඳහා විෂයයක් වශයෙන් පැවැත්වෙන පාලි පරීක්ෂණයට පහත දැක්වෙන අන්දමට පැය තුනේ ප්‍රශ්න පත්‍ර තුනක් ඇතුළත් වේ.

පාලි I (PLG 1) නිර්දිෂ්ට ග්‍රන්ථ
පාලි II (PLG 2) අනිර්දිෂ්ට ග්‍රන්ථ
පාලි III (PLG 3) සාහිත්‍ය ඉතිහාසය සහ බෞද්ධ චින්තාව

## පාලි I ( PLG 1 ) : නිර්දිෂ්ට ග්‍රන්ථ

නිර්දිෂ්ට ග්‍රන්ථ හැදෑරීමේදී එම ග්‍රන්ථයන්හි අර්ථාවබෝධය, විෂය, භාෂා තත්ත්වය, සාහිත්‍යමය අගය, කර්තෘත්වය හා කාලය පිළිබඳ, විචාරාත්මක දැනුම් අපේක්ෂා කරනු ලැබේ. ග්‍රන්ථාගත විෂය පිළිබඳ නිරාකූල අවබෝධයකට අවශ්‍ය වන පරිදි තදනුගත අටුවා හා ටීකාද පරිශීලනය කළ යුතුය. පාලි සාහිත්‍යාගත සෙසු කෘතීන් හා සමග නිර්දිෂ්ට ග්‍රන්ථයන්හි ඇති සම්බන්ධතාව, පාලි සාහිත්‍යයේත් බෞද්ධ චින්තාවේත් විවිධ අංශ හා එම ඉතිහාසයේ විවිධ අවස්ථා හැදෑරීමේදී එම ග්‍රන්ථයන්ගෙන් ලැබිය හැකි ආභාසය, තත්කාලීන සමාජයේ ආර්ථික, දේශපාලනමය, සාමාජික හා සංස්කෘතික අංශ පිළිබඳ අධ්‍යයනයකට අදාළ මූලාශ්‍ර වශයෙන් එම ග්‍රන්ථයන්හි ඇති උපයෝගිතාව යන කරුණු කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය.

### නිර්දිෂ්ට ග්‍රන්ථ:-

1. විනය මහාවග්ග: චීවරක්ඛන්ධක
2. දීඝනිකාය : තෙවිජ්ජ හා පායාසි සුත්තන්ත
3. සංයුත්ත නිකාය: සක්ක හා බ්‍රහ්ම සංයුත්ත
4. පෙතවත්ථු: උබ්බරිවග්ග
5. සුමංගලවිලාසිනී නිදාන කථා

## පාලි II ( PLG 2 ) අනිර්දිෂ්ට ග්‍රන්ථ, ගද්‍ය රචනය, පාලි ව්‍යාකරණ

පෙළ, අටුවා, ටීකා හා ප්‍රකරණ ග්‍රන්ථයන්ගෙන් උපුටා ගත් පාලි ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තනය කිරීමට නියම කරනු ලැබේ. අනිර්දිෂ්ට පාඨ පරිවර්තනය කිරීමේදී එම පාඨයන්හි එන කාරක ප්‍රයෝග, වාක් සම්ප්‍රදාය හා අර්ථ විශේෂතා පිළිබඳ නිරාකූල අවබෝධයක් ප්‍රකට විය යුතු අතර, පරිවර්තනයේ භාෂාව සම්මත ව්‍යාකරණ නීතිවලට අනුකූල විය යුතුය. නිර්දිෂ්ට මාතෘකාවක් අනුව පාලි වාක්‍ය රචනයක් කිරීම හෝ අර්ථ වශයෙන් ඒකාබද්ධ වූ ප්‍රමාණවත් ඡේදයක් පාලියට නැගීම හෝ ගද්‍ය රචනයෙන් අපේක්ෂා කරනු ලැබේ. භාෂා ප්‍රයෝගයෙහි පරිචය ප්‍රකට වන අයුරු, ව්‍යාකරණානුකූලවූත්, සම්භාවිත පාලි රීතියට අදාළ වූත් ගද්‍ය රචනය මෙහිලා විශේෂයෙන් අගය කරනු ලැබේ. සම්ප්‍රදායානුකූල පාලි ව්‍යාකරණය හා පාලි ඓතිහාසික ව්‍යාකරණය පිළිබඳ සාමාන්‍ය දැනුමක් ව්‍යාකරණය යටතේ අපේක්ෂා කරනු ලැබේ.

## පාලි III (PLG 3 ): සාහිත්‍ය ඉතිහාසය හා බෞද්ධ චින්තාව

සාහිත්‍ය ඉතිහාසය හැදෑරීමේදී පශ්චාත් ත්‍රිපිටක අටුවා ටීකා හා ප්‍රකරණ ඇතුළත් පාලි සාහිත්‍යයේ ඉතිහාසය පිළිබඳ විශේෂ දැනුමක් අපේක්‍ෂා කරනු ලැබේ. පශ්චාත් ත්‍රිපිටක පාලි සාහිත්‍යය විවිධ විෂය ක්‍ෂෙත්‍රයන්හි ව්‍යාප්ත වූ අයුරු, එහි දියුණුව සඳහා ආගමික සංස්ථාවන්ගෙන් හා ආචාර්ය පරම්පරාවන්ගෙන් ලැබුනු අනුග්‍රහයත්, සිංහල හා සංස්කෘත සාහිත්‍යයන්ගෙන් ලැබුණු ආභාසයක් පිළිබඳ විචාරාත්මක දැනුමක් ද මේ සඳහා අවශ්‍යය. පාලි සාහිත්‍යාගත බෞද්ධ චින්තාව හා එහි පිළිබඳ විචාරපූර්වක අධ්‍යයනයක් බෞද්ධ චින්තාව යටතේ අපේක්ෂා කරනු ලැබේ. මෙම අධ්‍යයනයෙහි දී මුල් බුදු සමයේ ආගමික, දාර්ශනික හා සංස්කෘතික පසුතලය ත්‍රිපිටකාගත බුදු සමයේ ප්‍රධාන ඉගැන්වීම් සහ එම ඉගැන්වීම්වල ඓතිහාසික වර්ධනයද, තත්කාලීන විවිධ ආගමික හා දාර්ශනික සම්ප්‍රදායයන් අතර බුදුසමයට හිමිවන තැනද, ආගමක් හා දර්ශනයක් වශයෙන් බුදු සමයේ විශේෂ ලක්‍ෂණද කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

### උපදෙශිත ග්‍රන්ථ

පොල්වත්තේ බුද්ධදත්ත හිමි - පාලි සාහිත්‍යය I, II
කන්නිමහර සුමංගල හිමි - පපාලි භාෂා විමර්ශනය
පී.පී.මලලසේකර - ලංකා පාලි සාහිත්‍යය
වල්පොල රාහුල හිමි - බුදුන් වදාළ ධර්මය
වල්පොල රාහුල හිමි - ලංකාවේ බුදුසමයෙහි ඉතිහාසය

ඊ.ජේ.තෝමස් - බෞද්ධ චින්තාවේ ඉතිහා සය
ඊ.ජේ.තෝමස් - බුද්ධ චරිතය
ඊ.ඩබ්ලිව්.අදිකාරම් - පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය
ඩී.ජේ.කලුපහන - භාරතීය දර්ශන ඉතිහාසය
ජේ.තිලකසිරි - වෛදික සාහිත්‍යය
පී.ඥාණාරාම හිමි - පරිනිර්වාණයට පසු සියවස් තුනක්
හේන්පිටගෙදර ඥාණසීහ හිමි - අභිධර්ම පරීක්‍ෂණය
මහරහතන් වහන්සේ
ටී.ඩබ්ලිව්.රීස් ඩේවිඩ්ස් - බෞද්ධ භාරතය
චාල්ස් එලියට් - හින්දු සමය සහ බුදු සමය II
එම්.හිරියන්න - සංක්‍ෂිප්ත ඉන්දීය දර්ශනය
ඇල්.චන්දරතන හිමි - පාලි අඨකථා සාහිත්‍යය
බී.සී.ලෝ - ලංකාවේ වංස කථා
බී.සී.ලෝ - අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ
රේරුකානේ චන්දවිමල හිමි - චතුරාර්ය සත්‍යය
රේරුකානේ චන්දවිමල හිමි - පටිච්ච සමුප්පාද විවරණය
ධාරා (රීස් ඩේවිඩ්ස් අංකය) - පාලි භාෂාව නමැති ලිපිය
එන්.ඒ.ජයවික්‍රම සහ කාන්ගහආරච්චි - ථෙරීගාථා ව්‍යාඛ්‍යාව, (ප්‍රස්තාවනාව)
යක්කඩුවේ ප්‍රඥාරාම හිමි - මජ්ඣිම නිකාය සමන්තෙන සනා
මාර්ටින් වික්‍රමසිංහ - ථේරී ගී (ප්‍රස්තාවනාව)

අ.පි.බ.

| | |
|---|---|
| ඩී.ඊ.හෙට්ටිආරච්චි | - ප්‍රාකෘත සංග්‍රහය |
| | සිංහල විශ්ව කොෂය (අදාළ ලිපි) |
| මයිලෑවේ සිරිනිවාස හිමි | - පාලි ව්‍යාකරණ විවරණය |
| වී.පර්නියෝලා | - පාලි ව්‍යාකරණය |
| පොල්වත්තේ බුද්ධදත්ත හිමි | - පාලි භාෂාවතරණය I - III |
| කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර හිමි | - ඉතිවුත්ත පාළිය (ප්‍රස්තාවනාව) |
| බද්දේගම විමලවංශ හිමි | - බෞද්ධ සාහිත්‍යය |
| මාලිම්බඩ ඥාණනන්ද හිමි | - වංශ සාහිත්‍යය |
| නාරාවිල ධම්මරතන හිමි | - භාරතීය දර්ශන |
| J.D.Dhirasekara | - Buddhist Monastic Discipline |
| B.M.Barua | - Pre-Buddhist Indian Philosophy |
| K.N.Jayatilleke | - Early Buddhist Theory of Knowledge |
| M.Winternitz | - History of Indian Literature, Vol |
| G.P.Malalasekera | - Pali Literature of Ceylon |
| Mabel Bode | - Pali Literature of Burma |
| W.Geiger | - Pali Literature and Language |
| G.C.Pande | - Studies on the Origine of Buddhism |
| Charles Eliot | - Hindusim and Buddhism |
| R.Fick | - Social Organisation |
| E.J.Raoson | - Cambriage History of India, Vol. |
| A.T.Bose | - Social and Rural Economy of North India, Vols I & II |
| A.A.Macdonell | - India's Past |
| Duraiselle | - Pali Grammer |
| Max Muller | - Pali Grameer |
| A.C.Woolner | - Introduction to Prakrit |
| E.J.Thomas | - Life of Buddhism |
| | History of Buddhist Thought |
| S.Radhakrishnan | - Indian Philosophy, Vol. I |
| N.Dutt | - Aspects of Mahayana Buddhism |
| | Three Principal Schools of Buddhist |
| M.Hiriyanna | - Outline of Indian Philosphy |


************************